' කැළණිය අධ්‍යාපන මණ්ඩලයේ පාසල්වල සංවර්ධන විභවතාවන්.'

' Development Potentials of the Schools in Kelaniya Education Circuit.'

UCLIB
400717

ඩබ්.ඩබ්.ආර්.ඩබ්.එම්.බී.එම්.වීරසූරිය,
අධ්‍යාපන දර්ශනපති උපාධිය,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය.

1985.11.28.

CR

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

# සංක්ෂේපයෙන්..

වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල ඇති ජනප්‍රිය පාසැල් සෑම එතකටම වාගේ අද බැරෑරුම් අර්බුදයකට මුහුණ පෑමට සිදුවී ඇත. දෙමාපියන්, තම දරුවන් ජනප්‍රිය පාසැලකටම ඇතුළත් කිරීමට එක අතකින් වෙර දරන අතර, ඒ ඒ පාසැල්වල පවතින ඉඩකඩ ප්‍රමාණය අනුව අපේක්ෂිත කාටත් අපේක්ෂිත පාසැල නොලැබී යෑම නිසා අද මෙය බලවත් ගැටළුවක්ව පවතී. මෙම අධ්‍යයනයෙන් මා බලාපොරොත්තු වූයේ ශ්‍රී ලංකාවේ අගනුවර වන කොළඹ ජනප්‍රිය පාසැල්වලට, තදාසන්න ප්‍රදේශවලින් ඇදී යන සංඛ්‍යාව අඩුකිරීමට කිසියම් පිළියමක් යෙදිය හැකිද? කියා සොයා බැලීමය. ඒ සඳහා මෙහි හඳුන්වා දී ඇති පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සීමාවේ පිහිටා ඇති කැළණිය අධ්‍යාපන මණ්ඩලයේ පාසැල් පිළිබඳ අධ්‍යයනයක් කර එම පාසැල්වල සංවර්ධන විභවතාවයන් තුළින් මෙම ගැටළුවට කිසියම් නිරාකරණයක් ලබාගත හැකිද? කියා විමසා බැලීම මගේ අරමුණ විය.

මගේ අධ්‍යයනය ප්‍රධාන පරිච්ඡේද පහකින් සමන්විතය. පළමුවන පරිච්ඡේදයෙන් සමාජයක හැඩගැස්මට අධ්‍යාපනයේ ඇති අවශ්‍යතාවය පිළිබඳ කෙටි විවරණයකින් පසු මෙවැනි ගැටළුවක් අධ්‍යයනය කිරීමේ වැදගත්කම පිළිබඳව පෙන්වා දී ඇත. දෙවැනි පරිච්ඡේදයේදී අධ්‍යයනයට පසුබිම් වූ ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කම, භූගෝලීය පිහිටීම, සමාජ ආර්ථික වාතාවරණය, අධ්‍යාපන තොරතුරු පිළිබඳව තොරතුරු විවරණයක් කිරීමට අවස්ථාවක් කර ගත්තේ, එමගින් මතු පරිච්ඡේදවලදී අදාල තොරතුරු විග්‍රහ කිරීමට මහඟු රුකුලක් ලැබෙන හෙයිනි. අධ්‍යයනයෙහි සැලැස්ම තෙවැනි පරිච්ඡේදයේදී දැක්වෙන අතර නියැදිය තේරීම හා දත්ත ලබාගත් ආකාරය පැහැදිලි කර ඇත. සිව්වෙනි පරිච්ඡේදයෙන් අදාල ප්‍රදේශයේ පාසැල්වල විධිමත් අධ්‍යාපනයට බලපාන සාධක පිළිබඳ විවරණයකි. මානව සම්පත්, භෞතික සම්පත්, මූල්‍ය සම්පත්, භෞමීය සම්පත් වශයෙන් අනුකොටස්වලින් ප්‍රදේශයේ පාසැල්වල සම්පත් පිළිබඳ විග්‍රහයක් කරමින් වත්මන් අධ්‍යාපන සැලසුම්කරණයේ අරමුණු හා එය කොතෙක් දුරට මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේද? කියා සොයා බැලීමක් කෙරේ. අධ්‍යයනය ඇසුරෙන් ගතහැකි නිගමන හා යෝජනා පස්වැනි පරිච්ඡේදයෙන් දැක්වේ.

UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

මේ අනුව වර්ග සැතපුම් 9 ක් තුළ පිහිටා ඇති කැළණි මණ්ඩලයේ පාසැල්වලින් 1[A] ශ්‍රේණියේ පාසැල් එකක්වත් නොමැති වුවත් මේවා අතර ජනප්‍රිය පාසැල් හා ජනප්‍රිය නොවන පාසැල් වශයෙන් පැහැදිලි බෙදීමක් දක්නට ලැබේ. මෙයින් ජනප්‍රිය පාසැල්වලට අගනුවර ජනප්‍රිය පාසැල්වලට මුහුණ පෑමට ඇතිවන ගැටළු හා සමාන ගැටළු සිසුන් ඇතුළත්කිරීමේදී ඇතිවන බව පෙනිනා. ප්‍රදේශයේ දෙමාපියන් අගනුවර ජනප්‍රිය පාසැල කෙරෙහි පළමු අවධානයත්, ප්‍රදේශයේ ජනප්‍රිය පාසැල කෙරෙහි දෙවැනි අවධානයත්, ආසන්න පාසැල කෙරෙහි තෙවැනි අවධානයත් දක්වන බව පෙනිනා.

සිසුන්ගේ සාධන මට්ටම අනුව ගම්පහ අධ්‍යාපන දිස්ත්‍රික්කය ශ්‍රී ලංකා-වේ අධ්‍යාපන දිස්ත්‍රික්ක අතුරෙන් අද්විතීය ස්ථානයක සිටී. එයිනුත් ගම්පහ දිස්ත්‍රික්-කයේ අධ්‍යාපන මණ්ඩල 8 න් කැළණි මණ්ඩලය දෙවැනි වනුයේ ගම්පහ අධ්‍යාපන මණ්ඩලයට පමණි. ප්‍රදේශයේ පාසැල්වල මානව, භෞතික, භෞමීය, හා මූල්‍ය සම්-පත්වල ඌනතා මගහරවාගත හැක්කේ නම් ප්‍රදේශයේ පාසැල්වල ප්‍රගතියක් ඇතිකළ හැකි බව පෙනිනා. පිරිමි ළමුන්ට වඩා මෙම ප්‍රදේශයේ ගැහැණු ළමුන්, විධිමත් අධ්‍යාපනයට ඇතුළත්වන බවත්, ඉහළ සාධන මට්ටමක ඇති බවත් පෙනිනා. විවිධ හේතූන් නිසා 6.43% සංඛ්‍යාවක් නැවත රැඳෙන්නවුන් වන අතර, අතරමග ගිලිහීමට ප්‍රධානම හේතුව පහත් ආර්ථික වාතාවරණය බව පෙනිනා. කැළණිය ප්‍රදේශයේ කාර්-මික පුරයක් වුවත්, ප්‍රදේශයේ ඇති සම්පත් හා රැකියා අනුව විධිමත් අධ්‍යාපනයේ සම්බන්ධතාවය මඳ බව පෙනිනා. ප්‍රදේශයේ පාසැල්වල ඇත්තේ ගුරු හිඟයක් නොව, අවශ්‍ය ගුරු හිඟයකි. කෙසේ වෙතත් 1986 සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරො-ත්තුවන කලාපීකරණය මගින් සම්පත් බෙදා දීමේදී වරප්‍රසාද අඩු, දුප්පත් පාසැල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළයුතු බව පෙනිනා. සීමිත පාසැල් සංඛ්‍යාවකට පමණක් ලැබෙන වරප්‍රසාද හැම පාසැලකටම ලැබිය යුතුව ඇත.

මේ තුමන අයුරකින් ප්‍රදේශයේ පාසැල් නංවාලූවත්, පොදු ජනතාව තුළ ඇත්තේ කොළඹ ජනප්‍රිය පාසැලෙන් ලැබෙන අධ්‍යාපන මට්ටය, සමාජ තත්ත්වය

විශේෂත්වයක් දරන බවති. ප්‍රදේශයේ පාසැල්වලම සේවය කරන ගුරුවරුන්ගේ දරුවන් ප්‍රදේශයේ පාසැල් තුළ රඳවා ගතයුතුව ඇත. නමුත් අවසාන වශයෙන් කිව හැක්කේ දෙමාපියන් තුළ මුල් බැසගෙන ඇති ආකල්ප වෙනස් නොවන තාක් මෙම ගැටළුව පවතින අතර, ප්‍රදේශයේ පාසැල්වල තත්ත්වය නංවාලීමෙන් දෙමා- පියන් තුළ ක්‍රම ක්‍රමයෙන් කිසියම් විශ්වාසයක් ඇති කළ හැකි බවති.

XXXXXX